සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව - පිළිතුරු | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | පැය / மணித்தியாலம் / Hours: |

## I කොටස

1) 3
2) 2
3) 1
4) 3
5) 4
6) √
7) X
8) √
9) X
10) √
11) 2
12) 4
13) 1
14) 3
15) 2
16) අඟහරු
17) යුරේනස්
18) නෙප්චූන්
19) සිකුරු
20) පාකිස්ථානය

## II කොටස

1. අ. අදාළ තැන් උස යා කරමින් සමෝච්ච රේඛා අඳ තිබීම.රේඛා 06 සඳහා ලකුණු එක බැගින් (ලකුණු 06)

   ආ.1. දුඹුරු වර්ණයෙන් මීටර 620ට වඩා උස් බිම් දෙක සේයා කිරීම. (ලකුණු 02)
   2. A ශ්‍රේණියේ ප්‍රධාන මාර්ගය රතු වර්ණය යොදා තිබීම. (ලකුණු 02)
   3. B නැමැති ප්‍රධාන ගංගාව සඳහා ලා නිල් වර්ණය යොදා තිබීම. (ලකුණු 02)
   4. C නැමැති ස්ථානයේ දුම්රිය පොලක් D නැමැති ස්ථානයේ දුම්රිය නැවතුම රතු වර්ණයෙන් ඇඳ තිබීම. (ලකුණු 02)
   5. E නැමැති වැව නිල්පාට වර්ණ කිරීම.
   6. F දක්වා වැවේ සිට වාරි ඇල නියමිත සංකේතයෙන් හා වර්ණයෙන් ඇඳ දැක්වීම. (ලකුණු 02)

2. i. දූවිලි හා වායු අංශු (ලකුණු 02)

   ii. 1. පෘථිවියේ ජීවයේ පැවැත්මට අවශ්‍ය ශක්තිය ලබා දෙන ප්‍රධාන මූලය වීම.
   2. සෞරග්‍රහ මණ්ඩලය මධ්‍යයේ පිහිටා තිබීම.
   3. සූර්යයාගේ අභ්‍යන්තරයේ සිදුවන විවිධ ප්‍රතික්‍රියා නිසා අධික තාපයක් නිකුත් වීම.
   4. සූර්යයාගේ මධ්‍යයේ උෂ්ණත්වය $15000000^{0}c$ වීම.
   5. මතුපිට උෂ්ණත්වය $6000^{0}C$ ක් පමණ වීම ආදී කරුණු හතරක් (ලකුණු 04)

   iii. a. ප්ලූටෝ, එරිස්, සෙරිස්, මාකේ මාකේ, හෝමියා මින් දෙකක් (ලකුණු 02)

b. ග්‍රහක සෞරග්‍රහ මණ්ඩලය නිර්මාණය වීමේ දී ශේෂ වූ කැබලි ලෙස සැලකේ. ඒවා ඝන පාෂාණ වලින් නිර්මාණය වී ඇති අතර, නිශ්චිත හැඩයක් නොමැති විවිධ විශාලත්වයෙන් යුත් අභ්‍යවකාශ වස්තූන් ය. අඟහරු සහ බ්‍රහස්පති ග්‍රහලෝක අතර ග්‍රහක මිලියනයටකට අධික සංඛ්‍යාවක් වළල්ලක් ලෙස පිහිටා ඇත. කෙටියෙන් විස්තර කිරීමට (ලකුණු 03)

3. i. 1. දිවා රාත්‍රි ඇතිවීම.
   2. වේලාවේ ප්‍රාදේශීය වෙනස්කම් ඇතිවීම. (ලකුණු 02)

   ii. 1. ජීවීන්ට හිතකර වායූන්ගෙන් සමන්විත මෙන්ම ජල වාෂ්ප සහිත වායුගෝලයක් පැවැතීම.
   2. ජලය පැවැතීම.
   3. මධ්‍යස්ථ උෂ්ණත්වයක් පැවැතීම.
   4. භ්‍රමණය හා පරිභ්‍රමණය සිදු වීම.
   5. ගුරුත්වාකර්ෂණ බලය පැවැතීම ඇදී කරුණු හතරක් (ලකුණු 04)

   iii. a. දේශාංශ $0^0$- ග්‍රිනිච් රේඛාව
   අක්ෂාංශ $0^0$ - සමකය
   b. පෘථිවිය මත ඕනෑම තැනක පිහිටීම හඳුනා ගැනීමට හැකි වන පරිදි පෘථිවිය වටා නිර්මාණය කර ඇති කල්පිත රේඛා ජාලය අක්ෂාංශ හා දේශාංශ රේඛා ලෙස හැඳින්වේ. (ලකුණු 03)

4. i. ද්‍රව, ඝන, වාෂ්ප මින් දෙකක් සඳහා (ලකුණු 02)

   ii. 1. වායුව ජීවයේ පැවැත්මට අවශ්‍ය මූලිකම සාධකය වේ.
   2. ජල වාෂ්ප රඳවා ගැනීමෙන් ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වය සඳහා උපකාරී වේ.
   3. ඉහල වායු ගෝලයේ ඇති ඕසෝන් වායු ස්ථරය මගින් සූර්ය විකරණයේ ඇති ජීවීන්ට අහිතකර කිරණ පෘථිවිය කරා ඒම පාලනය කරයි.
   4. අභ්‍යවකාශයේ සිට පෘථිවිය දෙසට එන උල්කාපාත වායුගෝලය හා ගැටීමේදී දැවී යාම නිසා ඒවා පෘථිවිය මත පතිත වීම පාලනය වේ.
   5. වායුව නිසා පාථිවි තලය මත උෂ්ණත්වය පාලනය වීම මින් කරුණු 04 ක් (ලකුණු 04)

   iii. a. 1. ජීවීන්ගේ පැවැත්මට අවශ්‍ය සාධකයකි.
   2. ගෘහස්ථ කටයුතු සඳහා
   3. සියලුම කෘෂිකාර්මික කටයුතු සඳහා
   4. විවිධ කර්මාන්ත සඳහා
   5. පරිවහන කටයුතු සඳහා
   6. විදුලිබල උත්පාදනයට
   7. විනෝද කටයුතු සඳහා ආදී කරුණු දෙකක්. (ලකුණු 02)

   b. කර්මාන්ත මගින් අපද්‍රව්‍ය මුදා හැරීම, ගෘහස්ථ කටයුතු මගින් කැලි කසල මුදා හැරීම, කෘෂිකාර්මික කටයුතුවලදී කෘමි නාශක හා රසායනික පොහොර මගින් වැනි මානව කටයුතු හේතුවෙන් ජලයට අපවිත්‍ර වූ ජලය මුදා හැරීම නිසා ජල දූෂණය සිදු වේ. මෙවැනි කරුණු දෙකක් විස්තර කර තිබීම. (ලකුණු 03)

5. i. a. නැගෙනහිර මායිම - බෙංගාල බොක්ක

b. බටහිර මායිම - අරාබි මුහුද (ලකුණු 02)

ii. භූමියා, කසා, දරඩ්, ලෙප්චා, ෂෙර්පා ආදි ජන වර්ග 4ක් (ලකුණු 04)

iii. a. 1. කඳු නැගීමට හැකි වන ලෙස ශක්තිමත්ව පිහිටි පැතලි පුළුල් පතුල් සහත පාද
2. බර ඉසිලීමට හැකි ලෙස ශක්තිමත් වූ බාහු
3. අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත් වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු ආදී කරුණ දෙකක් (ලකුණු 02)

b. කෘෂි කර්මය හා සත්ව පාලනය ප්‍රධාන ජීවන රටාව වේ. කඳු අතර බිම්වල හෙල්මළු වගාව සිදු කරයි. කඳු ආශ්‍රිත ප්‍රදේශවල ගවයන් හා බැටළුවන් ඇති කරයි. කඳු නගින අයට මඟ පෙන්වීම, භාණ්ඩ අලෙවි කිරීම හා බර උසුලාගෙන යාම වැනි සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා කරයි. කාන්තාවෝ රෙදි විවීම , නූල් ගෙතීම වැනි රැකියාවල නිරත වෙති. මෙම කරුණු කෙටියෙන් ලියා තිබීම.

(ලකුණු 03)

6. i. නේපාලය, භූතානය (ලකුණු 02)

ii. 1. වැලිතලා සහිත පැතිරුණු භූමිය
2. මිලිමීටර 250ට අඩු වර්ෂාව
3. අධික වාෂ්පීකරණයක් පැවැතීම.
4. අධික උෂ්ණත්වයක් පැවැතීම. ආදී කරුණු 4ක් සඳහා (ලකුණු 04)

iii. a. 1. හෝටල් ආශ්‍රිත රැකියා
2. විසිතුරු භාණ්ඩ අලෙවිය
3. ආයුර්වේද මධ්‍යස්ථාන
4. සංචාරක මඟ පෙන්වන්නන් ලෙස
5. වෙළඳාම
6. වරාය ආශ්‍රිත රැකියා යනාදි කරුණු දෙකක් (ලකුණු 02)

b. කඩොලාන, තෙත් බිම්, සන වගුරු, ඒ අතර සුවිශේෂී පරිසර පද්ධති වේ. පරිසරය තුළ ශාක විශේෂ , උරග, පක්ෂි විශේෂ හා මත්ස්‍ය විශේෂ ආදියේ විවිධත්වය දක්නට ඇත. මෙම කරුණු කෙටියෙන් විස්තර කිරීම සඳහා (ලකුණු 03)

7. i. භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ යනු භූමිය මත පිහිටි ස්වාභාවික ලක්ෂණ භෞතික ලක්ෂණ ලෙසත් මිනිසාගේ මැදිහත් වීමෙන් නිර්මාණය කර ඇති ලක්ෂණ සංස්කෘතික ලක්ෂණ ලෙසත් හැඳින්වේ. (ලකුණු 02)

ii. a. දිග 12cm =6 km පළල 8 cm =4 km (ලකුණු 02)
b. පළාත් දිස්ත්‍රික්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස , ග්‍රාම නිලධාරී කොට්ඨාස නගර සභා සීමා ආදී පරිපාලන මායිම් දෙකක් සම්මත වර්ණයෙන් හා සංකේත මඟින් ඇඳ තිබීම. (ලකුණු 02)

iii. a. කඳු වැටි, කොත්කන්ද, තැනිතලා, නෙරුව, නිම්න, කපොලු (ලකුණු 02)
b .ඉහත එක් ලක්ෂණයක් පිළිබඳ කෙටියෙන් විස්තර කර තිබීම. (ලකුණු 03)